**ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය - 2014**

**-------------------------------------------**

ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සම්බන්ධයෙන් වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2014 අංක 3 දරන ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ 10 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (**ISSAI 1000-1810**) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 ආයතනය පිහිටුවීම සහ අරමුණු

-----------------------------------

2014 අංක 3 දරන ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යටතේ ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය සංස්ථාගත කර තිබූ අතර එහි පොදු පරමාර්ථ පහත දැක්වේ.

(අ) භූ විද්‍යාවට අදාළ දැනුම අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම සහ දැනුම හුවමාරු කිරීම;

(ආ) භූ විද්‍යාත්මක කරුණු පිළිබඳව පර්යේෂණාත්මක කටයුතු දිරි ගැන්වීම ;

(ඇ) විවිධ ශ්‍රේණිවල සාමාජිකත්වයට ඇතුළත් කිරීම සඳහා අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම;

(ඈ) එහි වෘත්තීමය කටයුතු පාලනය කිරීම සහ එහි සාමාන්‍ය ක්‍රියාකාරකම්වල උසස් තත්ත්වයන් පවත්වා ගැනීමට ආධාර කිරීම;

(ඉ) භූ විද්‍යාත්මක වෘත්තීය කටයුතුවලට අදාළ සියලු කාරණාවලදී වෘත්තීමය සහ සදාචාරාත්මක ප්‍රතිපත්ති සහ ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම;

(ඊ) භූ විද්‍යාඥයින්ගේ අභිලාශයන් සහ තත්ත්වය වැඩි දියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(උ) රටේ අභිවෘද්ධියට හා සංවර්ධනයට අදාළ කටයුතුවලදී භූ විද්‍යාව අදාළ කර ගැනීම හා සම්බන්ධ කාරණාවලදී රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලට සේවා සැපයීම ; සහ

(ඌ) ආයතනයේ පරමාර්ථ වැඩිදියුණු කිරීමෙහිලා ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල සමාන වෘත්තීමය ආයතන සමග සම්බන්ධීකරණය ඇති කිරීම.

**1.5 මතය ව්‍යාචනය සඳහා පදනම**

**------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ආදායම් ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මතය ව්‍යාචනය**

**-------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**----------------------------------------**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**-----------------------------------------**

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳව වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ප්‍රකාරව රාජ්‍ය අංශයේ අස්තිත්වයක් විසින් ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් සමන්විත විය යුතු සංරචකයක් අතුරින් ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතන විසින් 2014 දෙසැම්බර් 31 දිනට විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුල පහත සංරචකයන් ඉදිරිපත් කර නොතිබුණි.

(i) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය
(ii) ශුද්ධ වත්කම්/ස්කන්ධයේ වෙනස්වීමේ ප්‍රකාශනය
(iii) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
(iv) වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුළත් සටහන් හා අනෙකුත් විස්තරාත්මක සටහන්.

**2.3 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**------------------------------------------------------------------------**

පහත සඳහන් නීති රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති හා රෙගුලාසිවලට යොමුව**<br>**-----------------------------------** | **අනුකූල නොවීම්**<br>**-------------------** |
|---|---|
| 2014 අංක 03 දරන ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත<br>(අ) 7 වන වගන්තිය | සංස්ථාවේ මහා සභා රැස්වීමකදී ඡන්දය දෙන සාමාජිකයන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් රීති සෑදීම කළයුතු බව සහ ඒවා රජයේ ගැසට් පත්‍රයේ පළ කළ යුතු බව දන්වා ඇතත් එසේ සාදන ලද රීති සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් රජයේ ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 8 වන වගන්තිය | සාමාජිකයන්ගේ නම්, ලිපිනයන් සහ වෙනත් අත්‍යාවශ්‍ය තොරතුරු ඇතුළත් කර සාමාජික ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට රු.253,113ක අතිරික්තයක් විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

2014 අංක 3 දරන ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීම්) පනත ප්‍රකාරව භූ විද්‍යාත්මක කටයුතුවල නිරතවන ප්‍රධානම ආයතනය බවට පත්වෙමින් ජාතික සංවර්ධනයට දායක වීම හා ජාත්‍යන්තර ආයතන අතර සමාන තත්ත්වයකට පත්වීම ආයතනයේ ප්‍රධාන අරමුණු වුවද සමාලෝචිත වර්ෂය තුළ ආයතනය විසින් එම අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර වර්ෂයේ සමස්ත වියදමෙන් සියයට 92 ක් හෙවත් රු.239,700 ක් වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්වීම සඳහා වැයකර තිබුණි.